*සැ. යු.-* (i) 2019.01.11 දින පළවූ අංක 2106 දරන ගැසට් පත්‍රයේ IV (අ) කොටස පළ නොවීය.
(ii) මෙවර පළවන ගැසට් පත්‍රයේ VI කොටසේ 2019 වර්ෂය සඳහා බදුල්ල දිස්ත්‍රික්කයට අයත් අධිකරණ කලාපවල ජූරි සභිකයින්ගේ නාමාවලියක් සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂාවන්ගෙන් පළවේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,107 - 2019 ජනවාරි මස 18 වැනි සිකුරාදා - 2019.01.18**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබෑර්තු .... ... ... | - | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 104 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2019 පෙබරවාරි මස 08 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2019 ජනවාරි මස 25 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2019 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම ගැසට් පත්‍රය *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අතිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

## විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාග ශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාග ශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය**

රජයේ භාෂා පරිවර්තක සේවයේ I වන පන්තියේ නිලධාරින් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2014(2018)

1994.07.26 දිනැති අංක 829/7 දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලද භාෂා පරිවර්තක සේවය පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ 8 වන ඡේදය යටතේ සලසා ඇති විධිවිධාන මත භාෂා පරිවර්තක සේවයේ I වන පන්තියේ නිලධාරින් සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාගයක්, විභාග කොමසාරිස් ජනරාල් විසින් 2019 අප්‍රේල් මස කොළඹ දී පවත්වනු ලබන අතර, මෙම විභාගයට සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා මාධ්‍යවලින් ඉදිරිපත් විය හැකිය. විභාගය සඳහා ඉල්ලුම් කරනු ලබන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. මෙම නිවේදනයට අනුව අදාළ කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා අයදුම් කළහැක්කේ රාජ්‍ය සේවයේ ඒකාබද්ධ සේවයට අයත් නිලධාරීන්ට පමණි.

***සටහන*** - මෙම ගැසට් නිවේදනයට සමගාමීව පළාත් රාජ්‍ය සේවයේ භාෂා පරිවර්තක සේවයේ අයදුම්කරුවන් වෙනුවෙන් වන විධිවිධාන අදාල පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා මඟින් ද අනෙකුත් අදාළ ආයතනවල අයදුම්කරුවන් වෙනුවෙන් වන විධිවිධාන එම ආයතන මඟින් ද නිකුත් කරනු ඇත.

ඒ ඒ පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන් සහ මෙම විභාගයට අයදුම්කරන අනෙකුත් ආයතනවල නිලධාරීන්ගේ අයදුම්පත් වෙන්කර ගැනීමේ පහසුව සඳහා අයදුම්පතේ ශීර්ෂයේ අදාළ සේවාව හෝ ආයතනය දැක්වීමේදී සංකේත අංකයක් ඇතුළත් කළ යුතු වේ. ඒ අනුව ඒකාබද්ධ සේවයට අයත් නිලධාරීන්ගේ සංකේත අංකය 10 වේ. එම අංකය අයදුම්පතේ දකුණු පස ඉහළ ඔබ අයත් සේවය යන ස්ථානයේ සටහන් කළ යුතුය.

02. මෙම විභාගය සඳහා ඉල්ලුම් කිරීමේ ආදර්ශ අයදුම්පතක් මෙම නිවේදනය අවසානයේ පළකර ඇත. නිවැරදිව හා පැහැදිලිව පිළියෙල කරනු ලබන අයදුම්පත් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් 2019 පෙබරවාරි මස 18 වැනි දින හෝ ඊට ප්‍රථම විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන (ආයතනික හා විදේශ විභාග) ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ. පෙ. 1503, කොළඹ වෙත ලැබෙන ලෙස ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් විභාග කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කරන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ විභාගයේ නම සඳහන් විය යුතුය. අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ඇත.

03.(i) අයදුම්පතේ ශීර්ෂ අංක 1.0 සිට 5.2 තෙක් පළමුවන පිටුවට ද, ඉතිරිය දෙවන පිටුවට ද, වන ලෙස ගෙන අයදුම්පත ''ඒ4'' ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් පිළියෙල කර ගත යුතුය. අයදුම්පත යතුරු ලියනය කර පිළියෙල කර ගත හැකි වුව ද, එය අයදුම්කරුගේ අත් අකුරින්ම පිරවිය යුතුය. ආදර්ශ අයදුම්පතට අනුකූල නොවන සහ අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

(ii) රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියේ පරමාර්ථයන් සඳහා සියලුම අයදුම්කරුවන් විසින් තමන්ගේ අයදුම්පත් රාජ්‍ය භාෂාවෙන් ම පිළියෙල කළ යුතු අතර ඒවා එම භාෂාවෙන් ම පිරවිය යුතුය. විභාග අයදුම්පතේ ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්වල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්වල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද සඳහන් කරන්න.

04. විෂය නිර්දේශය හා විභාග පරිපාටිය :

පළමුවන විෂයය :- ප්‍රශ්න පත්‍ර අංක 01

(i) පොදු වැදගත්කමක් ඇති පාඨයකින්,
(ii) (අ) නිල ලේඛනයකින් හෝ වාර්තාවකින් හෝ උපුටාගත් කොටසක් : සහ
(ආ) පුවත්පත් ලිපියකින් හෝ වාර්තාවකින් උපුටාගත් කොටසක්,
අයදුම්කරුවන් තම භාෂා පරිවර්තන මාධ්‍යයන් අනුව තෝරා ගත් පහත සඳහන් ආකාරවලින් එකක් අනුව පරිවර්තනය කිරීම.
(i) සිංහලෙන් දෙමළ බසට
(ii) සිංහලෙන් ඉංග්‍රීසියට
(iii) දෙමළ බසින් ඉංග්‍රීසියට
ලකුණු 100 යි- පැය 3 ක ප්‍රශ්න පත්‍ර එකකි.

දෙවන විෂයය : ප්‍රශ්න පත්‍ර අංක 02

(i) පොදු වැදගත් කමක් ඇති පාඨයකින්,
(ii) (අ) නිල ලේඛනයකින් හෝ වාර්තාවකින් හෝ උපුටාගත් කොටසක් : සහ
(ආ) පුවත්පත් ලිපියකින් සහ වාර්තාවකින් උපුටාගත් කොටසක්

අයදුම්කරුවන් තම භාෂා පරිවර්තන මාධ්‍යයන් අනුව තෝරා ගත් පහත සඳහන් ආකාරවලින් එකක් අනුව පරිවර්තනය කිරීම
(i) දෙමළ බසින් සිංහලට
(ii) ඉංග්‍රීසියෙන් සිංහලට
(iii) ඉංග්‍රීසියෙන් දෙමළ බසට
ලකුණු 100 යි-පැය 3 ක ප්‍රශ්න පත්‍ර එකකි.

* සාමාර්ථය සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයකින් ලකුණු සියයට හතළිහක් (40%) ක් හෝ ඊට වැඩියෙන් ලබා ගත යුතුය.

05. අපේක්ෂකයන්ගේ අත් අකුරු පිළිබඳව සැලකිල්ලක් දක්වනු ලැබේ.

06. විභාග ගාස්තු :-

මෙම විභාගයට පෙනී සිටින අපේක්ෂකයන් වෙනුවෙන් පහත සඳහන් පදනම මත ගාස්තු අය කරනු ලැබේ.

(*අ*) පළමුවන වතාව සඳහා ගාස්තු අය නොකෙරේ.
(*ආ*) ඉන්පසු එක් වතාවක් සම්පූර්ණ විභාගය සඳහා රුපියල් 500 කි. එක් විෂයයක් සඳහා රුපියල් 200 කි.
(*ඉ*) විභාග ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 2003-02-13 ට බැරවන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම තැපැල්/උප තැපැල් කාර්යාලයකට ගෙවා අයදුම්කරුගේ නමින්ම ලබාගත් ලදුපතක් අයදුම්පතේ නියමිත ස්ථානයේ ඇලවිය යුතුය. එම ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම සුදුසුය.
(*ඊ*) කුමන කරුණක් යටතේ වුව ද මෙම විභාග ගාස්තුව ආපසු ගෙවීමක් හෝ වෙනත් කිසිම විභාගයක් සඳහා මාරු කිරීමට හෝ ඉඩදෙනු නොලැබේ.

07. විභාගයට ඇතුළත් කර ගැනීම :

(i) අයදුම්පත් ඉදිරිපත් කර ඇති සියලුම අපේක්ෂකයන්ට විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ලැබේ. විභාගයට පෙනී සිටින අපේක්ෂකයන් විභාග ශාලාධිපති වෙත ඔවුන්ගේ ප්‍රවේශ පත්‍ර අත්සන සහතික කරවා ගෙන ඉදිරිපත් කළ යුතුය. ප්‍රවේශ පත්‍ර නොමැතිව ඔවුන්ට විභාග ශාලාවට ඇතුළු වීමට හෝ විභාගයට පෙනී සිටීමට හෝ අවසර නොදෙනු ඇත. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පුවත්පත්වල හා දෙපාර්තමේන්තු නිල වෙබ් අඩවියේ පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 2 ක් හෝ 3 ක් හෝ ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. ඔබ වෙත තබාගත් විභාග අයදුම්පතේ හා විභාග ගාස්තු ගෙවා ලබාගත් ලදුපතේ සහතික කළ පිටපතක් ද, අයදුම්පත එවීමේ ලිපිය ලියාපදිංචි කළ කුවිතාන්සිය ද, ප්‍රවේශ පත්‍රයේ පිටපතක් එවීම සඳහා ඔබගේ ෆැක්ස් අංකයක් ද සඳහන් කරන ලද ඔබගේ ඉල්ලීම් ලිපිය ද විභාග දෙපාර්තමේන්තුව වෙත ෆැක්ස් මගින් යොමු කිරීම වඩාත් ඵලදායී වනු ඇත.

(ii) එක් එක් අපේක්ෂකයා වෙත ප්‍රවේශ පත්‍රය සමග කාලසටහනක් ද නිකුත් කරනු ලැබේ.

(iii) විභාග පැවැත්වීම පිළිබඳව විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවා ඇති නීතිරීති වලට අපේක්ෂකයින් බැඳී සිටිය යුතුය. මෙම නීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන ඕනෑම දඬුවමකට යටත් වීමට ඔවුනට සිදුවෙනවා ඇත.

(iv) අපේක්ෂකයින් සඳහා පනවා ඇති නීතිරීති මෙම *ගැසට්* පත්‍රය ආරම්භයේ මුද්‍රණය කර ඇත.

සටහන.-අයදුම්කරුවකු වෙත විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කරනු ලැබීම, මෙම විභාගයට ඉදිරිපත් වීම සඳහා අයදුම්කරු සපුරාලිය යුතු සුදුසුකම් පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

08. විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කර ඇති විභාග අපේක්ෂකයින්ට විභාගයට පෙනී සිටීමට හැකිවන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් රාජකාරි නිවාඩු දිය යුතුය. ගමන් ගාස්තු ගෙවනු නොලැබේ.

09. *අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය* : අපේක්ෂකයන්/ අපේක්ෂිකාවන්, විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් පාසාම විභාග ශාලාධිපතිට ස්වකීය අනන්‍යතාව ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන ලියවිලි අතුරෙන් කුමක් වුවත් භාරගනු ලැබේ.

(*අ*) ජාතික හැඳුනුම්පත
(*ආ*) වලංගු විදේශ ගමන් බලපත්‍රය
(*ඇ*) වලංගු රියදුරු බලපත්‍රය

තම ප්‍රවේශ පත්‍රයට අමතරව ඉහත සඳහන් ලියවිල්ලක් ඉදිරිපත් කළ නොහැකි අයදුම්කරුවකුගේ අපේක්ෂකත්වය විභාග කොමසාරිස් ජනරාල්ගේ අභිමතය පරිදි අවලංගු කළ හැකිය.

10. *ප්‍රතිඵල නිකුත් කිරීම*.- විභාග ප්‍රතිඵල විභාග කොමසාරිස් ජනරාල් විසින් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත නිකුත් කරන අතර අයදුම්කරුවන්ගේ ප්‍රතිඵල රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශ වෙබ් අඩවියේ පළ කිරීමට කටයුතු කරනු ඇත.

11. මෙම විභාග නිවේදනයේ විධිවිධාන සළසා නොමැති කවර කරුණක් පිළිබඳව වුව ද ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ තීරණය අවසාන තීරණය වන්නේය.

12. ''සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනය අනුව කටයුතු කරනු ලැබේ.''

කේ. වී. පී. එම්. ජේ. ගමගේ,
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්.

2019 ජනවාරි මස 03 වැනි දින,
රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය, කොළඹ 07.

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණයි)

ආදර්ශ අයදුම්පත්‍රය

**රජයේ භාෂා පරිවර්තක සේවයේ I වන පන්තියේ**
**නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2014 (2018)**

Efficiency Bar Examination for Officers in Class I of the Government Translators' Service-2014 (2018)

(*සැලකිය යුතුයි.*-මෙම ආකෘති පත්‍රය නිවැරදිව හා පැහැදිලිව අපේක්ෂකයාගේ/අපේක්ෂිකාවගේ අත් අකුරින්ම පිරවිය යුතුයි.)

ඔබ අයත්වන සේවය (මෙය සම්පූර්ණ කිරීමට පෙර *ගැසට් නිවේදනයේ* පළමු ඡේදය බලන්න) ☐

1.0 ගැසට් නිවේදනයේ 04 වන ඡේදය අනුව ඔබ පරිවර්තනයෙහි යෙදෙන ආකාරය

*ප්‍රශ්න පත්‍ර අංක 01 :*

| | | |
|---|---|---|
| සිංහලෙන් දෙමළ බසට | - 1 | |
| සිංහලෙන් ඉංග්‍රීසියට | - 2 | ☐ |
| දෙමළ බසින් ඉංග්‍රීසියට | - 3 | |

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

*ප්‍රශ්න පත්‍ර අංක 02 :*

| | | |
|---|---|---|
| දෙමළ බසින් සිංහලට | - 4 | |
| ඉංග්‍රීසියෙන් සිංහලට | - 5 | ☐ |
| ඉංග්‍රීසියෙන් දෙමළ බසට | - 6 | |

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

- ප්‍රශ්න පත්‍ර අංක 01 ට හෝ ප්‍රශ්න පත්‍ර අංක 02 ට හෝ එම ප්‍රශ්න පත්‍ර දෙකටම හෝ පෙනී සිටිය හැකිය.

2.0 පෞද්ගලික තොරතුරු :

2.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උදා: HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDENA)

2.2 අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම් වල මුලකුරු පසුව ද යොදා නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උදා: GUNAWARDHANA, H. M. S. K)

2.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

3.0 සේවා ස්ථානය හා ලිපිනය :

3.1 කාර්යාලයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ නම හා ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :
..........................................................................................................................

3.2 කාර්යාලයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ නම හා ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :
..........................................................................................................................

3.3 විභාග ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :.....................................................

4.0 4.1 ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐☐☐

4.2 උපන් දිනය : වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

5.0 දුරකථන අංක :

5.1 ජංගම : ☐☐☐☐☐☐☐☐☐☐

5.2 ස්ථාවර : ☐☐☐☐☐☐☐☐☐☐

6.0 ස්ත්‍රී පුරුෂ බව :
ස්ත්‍රී - 1
පුරුෂ -0 (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

7.0 දැනට දරන තනතුර :
7.1 තනතුර :————.
7.2 පත්වීම් ලිපියේ අංකය :————.

8.0 8.1 ඔබ විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට ද? :————.
8.2 එසේ නොවේ නම් ගෙවන ලද විභාග ගාස්තුව :————.
8.3 තැපැල්/උපතැපැල් කාර්යාලය :————.
8.4 ලදුපත් අංකය :————.
8.5 දිනය :————.

| |
|---|
| ලදුපත නොගැලවෙන සේ අලවන්න.<br>(ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගන්න) |

9.0 *අයදුම්කරුගේ සහතිකය :*

ඉහත සඳහන් විස්තර නිවැරදි බවත්, මෙම අයදුම්පත ආරම්භයේ දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් විභාගයට පෙනී සිටීමට මා හට හිමිකම් ඇති බවත්, මොනයම් ආකාරයේ හෝ විනයානුකූල දඬුවමකට භාජනය වී නොමැති බවත් ප්‍රකාශ කරමි. මෙම විභාගය සඳහා පනවා ඇති නීතිරීති පිළිපැදීමට ද එකඟ වෙමි. තව ද විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත්වන බව ද ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන

දිනය :————.

10.0 දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය :
(i) මෙම අයදුම්කරු/කාරිය මෙම දෙපාර්තමේන්තුවේ සේවයේ නියුක්තව සිටින ඒකාබද්ධ සේවයට අයත් භාෂා පරිවර්තක සේවයේ I වන පන්තියේ භාෂා පරිවර්තකයෙකු බව ද,
(ii) ඉහත සපයා ඇති විස්තර නිවැරදි බව ද,
(iii) ඔහුගේ/ඇයගේ වැඩ සහ හැසිරීම සෑම විටම සතුටුදායක බව ද, පසුගිය පස් අවුරුදු කාලසීමාව තුළ (අවවාද කිරීම් හැර) කිසිම ආකාරයක විනයානුකූල දඬුවමකට භාජනය නොවූ බව ද,
(iv) ඔහු/ඇය මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලබා ඇති බව ද,
(v) නියමිත විභාග ගාස්තුව ගෙවා එම ලදුපත අලවා ඇති බවත් මම සහතික කරමි. (අදාළ නොවේ නම් කපා හරින්න)

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන,
සහ නිල මුද්‍රාව.

පදවි නාමය :————.
ලිපිනය :————.
දිනය :————.

01-442

**ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය**
(ISO තත්ත්ව සහතිකයෙන් පිදුම්ලත් ආයතනයකි)

නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය

**ග්‍රැෆික්ස්, මල්ටිමීඩියා සහ මුද්‍රණ පාඨමාලා - 2019**

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ පාඨමාලා හදරා මුද්‍රණ, ග්‍රැෆික්ස් සහ මල්ටිමීඩියා ක්ෂේත්‍රයේ නිපුනයෙකු වන්න.

**පාසල් හැරගිය සිසුන් සඳහා ඕෆ්සෙට් ලිතෝ මුද්‍රණකරණය පිළිබඳ පූර්ණ කාලීන NVQ පාඨමාලාව**
**NVQ Training Programme in Offset Lithopress Operation for School Leavers (Full time)**

අද, දිවයිනේ ඉහළ රැකියා ඉල්ලුමක්ව පවතින ඕෆ්සෙට් මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරුවන් පුහුණු කිරීමේ පූර්ණ කාලීන පාඨමාලාවක් වන මෙම පුහුණු වැඩ සටහන තුළින් ඕෆ්සෙට් ලිතෝකරණය (Offset Lithography) Sheet Fed සහ Stream Feeder ලිතෝ මුද්‍රණ යන්ත්‍ර ක්‍රියා කරවීම ඇතුළු ඕෆ්සෙට් මුද්‍රණකරණයට අදළ ප්‍රායෝගික හා න්‍යායාත්මක දැනුම හා පුහුණුව ලබාදේ. පුහුණුව අවසාන කිරීමෙන් පසු ඔවුන් රැකියා සඳහා අනුයුක්ත කෙරේ.

*පාඨමාලා කාලය : මාස 14 යි (පූර්ණ කාලීන) මාධ්‍යය : සිංහල පාඨමාලා ගාස්තුව : රු. 22,500*

**මයික්‍රොසොෆ්ට් ඔෆීස් - Microsoft Office**

මෙම පාඨමාලාව තුළින් MS Office පිළිබඳ පූර්ණ අවබෝධයක් සහ පුහුණුවක් ලබා දෙන අතර පරිගණක භාවිතය පිළිබඳව ද මූලික දැනුම හා අවබෝධය ද ලබාදේ. මෙම පාඨමාලාව පාසල් හැරගිය නවකයන්ට මෙන්ම ආයතනවල රැකියාවන්හි නියුතු පුද්ගලයන්ට ද MS Office පිළිබඳව පූර්ණ දැනුම හා අවබෝධය ලබා දේ.

*කාලය : මාස 04 (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල සහ ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 13,000*

**පරිගණක ආශ්‍රිත ග්‍රැෆික් නිර්මාණකරණය - Computer Graphic Design**

ග්‍රැෆික්, මුද්‍රණ හා මල්ටිමීඩියා ක්ෂේත්‍රයේ පවතින ඉහළ රැකියා ඉල්ලුමට සරිලන ලෙස මෙම පාඨමාලාව සකස් කර ඇති අතර ඒ තුළින් අද ග්‍රැෆික් නිර්මාණයට අවශ්‍ය සියලු මෘදුකාංග පිළිබඳ පුළුල් පුහුණුවක් ලබා දෙයි. මෙම පාඨමාලාව පාසල් හැරගිය සිසුන්ට හා ග්‍රැෆික් ක්ෂේත්‍රයේ නියැළෙන පුද්ගලයන්ට මනා දැනුම ද, පුහුණුව ද ලබා දේ.

*කාලය : මාස 04 1/2(අර්ධ කාලීන) මාධ්‍ය : සිංහල/ඉංග්‍රීසි*

පාඨමාලා ගාස්තුව : ආයතනික සහතිකපත් පාඨමාලාව රු. 17,000 NVQ සහතික පත් පාඨමාලාව රු. 22,500

**පරිගණක ආශ්‍රිත අකුරු ඇමිණීම සහ පිටු සැකසීම - Computer Typesetting and Desktop Publishing**

මෙම පාඨමාලාවට ඉතා ඉහළ ඉල්ලුමක් පවතින අතර මුද්‍රණ, ග්‍රැෆික්, ප්‍රචාරක හා ප්‍රකාශන ක්ෂේත්‍රයේ පවතින ඉහළ රැකියා ඉල්ලුමට සරිලන පාඨමාලා අන්තර්ගතයකින් සකස්වන අතර ග්‍රැෆික්, ප්‍රචාරක, මුද්‍රණ සහ ප්‍රකාශන ක්ෂේත්‍රයන්ට ඇතුළත් වීමට බලාපොරොත්තුවන නවකයින් සඳහා විශේෂයෙන් සැකසුණු පාඨමාලාවකි.

*කාලය : මාස 05 (අර්ධ කාලීන) මාධ්‍ය : සිංහල/ඉංග්‍රීසි* පාඨමාලා ගාස්තුව : රු. 13,500

**වෙබ් අඩවි නිර්මාණය - Web Designing**

මෙම පාඨමාලාව තුළින් වෙබ් අඩවි නිර්මාණය පිළිබඳ නවීන තාක්ෂණයට අනුකූලව පුළුල් අවබෝධයක් සහ පුහුණුවක් ලබා දේ. පරිගණක ක්ෂේත්‍රයේ නියැළි පුද්ගලයන්ට හා මෙම ක්ෂේත්‍රයට ඇතුළත් වීමට අදහස් කරන නවකයන්ට ද මෙම පාඨමාලාව ඉමහත් ප්‍රයෝජනවත් වේ.

*කාලය : මාස 04 (අර්ධ කාලීන) මාධ්‍ය : සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 16,500*

### පොත් බැඳීම හා නිමාකරණය - **Book Binding & Finishing**

මෙම පාඨමාලාවට ඉතා ඉහළ ඉල්ලුමක් ඇත. මේ තුළින් පොත් බැඳීම, නිමාව පිළිබඳ පුළුල් අවබෝධයක් හා න්‍යායාත්මක පුහුණුවක් ලබා දේ. මෙම පාඨමාලාව පාසල් හැරගිය සිසුන්ට මෙන්ම ක්ෂේත්‍රයේ නියැලි පුද්ගලයන්ට ද මහත් ප්‍රයෝජනයක් වේ.

*කාලය : මාස 07 යි (අර්ධ කාලීන) මාධ්‍ය : සිංහල පාඨමාලා ගාස්තුව : රු. 20,000*

### අරේඛීය සංස්කරණය - **Non Linear Editing**

මෙම පාඨමාලාව තුළින් රූපවාහිනී වැඩසටහන් සංස්කරණය සහ පිටපත් රචනය පිළිබඳ පූර්ණ ප්‍රායෝගික සහ න්‍යායාත්මක අවබෝධය ලබාදේ, පාසැල් හැරගිය සිසුන්ට ද වීඩියෝ, රූපවාහිනී, චලන රූප කර්මාන්තයේ සහ ඉලෙක්ට්‍රොනික් සන්නිවේදන හා චිත්‍රපට කර්මාන්තයේ නිරතවූවන් හටද මෙම පාඨමාලාව ඉමහත් ප්‍රයෝජනවත් වේ.

*කාලය : වසර 01 යි (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 23,000*

### ත්‍රිමාණ සජීවිකරණය - **Digital Animation**

මෙම පාඨමාලාව තුළින් පරිගණක ආධාරයෙන් ද්විමාන සහ ත්‍රිමාන චලන රූප නිර්මාණකරනය කිරීම සහ එම රූප, රූපවාහිනී සහ චිත්‍රපට මාධ්‍ය සඳහා යොදා ගන්නා අයුරු සවිස්තරාත්මකව පුහුණු කෙරේ.

*කාලය : මාස 06 යි (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල සහ ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 23,000*

### පරිගණක දෘඩාංග එකලස් කිරීම සහ සැකසීම - **Computer Hardware and Assembly**

මෙම පාඨමාලාව තුළින් පරිගණක දෘඩාංග/මෘදුකාංග සහ පරිගණක එකලස් කිරීම පිළිබඳව මනා දැනුමක් සහ අවබෝධයක් ලබා දෙන අතර එදිනෙදා පැන නගින දෘඩාංග/මෘදුකාංග වල අදාළ තාක්ෂණික හා ප්‍රායෝගික ගැටළු විසඳා ගැනීමට මහත් සේ මෙම පාඨමාලාව ප්‍රයෝජනවත් වේ. නවකයන්ට මෙන්ම පරිගණක තාක්ෂණයේ නියැලි පුද්ගලයන්ට ද මෙම පාඨමාලාව එකසේ ප්‍රයෝජනවත් වනු ඇත.

*කාලය : මාස 04 යි (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 12,500*

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ පාඨමාලා සියල්ල උසස් ප්‍රමිතියකට අනුව ක්‍ෂෙත්‍රයේ රැකියාවලට ගැලපෙන අයුරින් සකස්කොට ඇති අතර පාඨමාලා සාර්ථකව නිමකරන සිසුන් හට රජය හා ජාත්‍යන්තරව පිළිගත් වටිනා සහතික පත්‍රයක් ප්‍රදානය කෙරේ.

පාඨමාලා අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව.

අංක. 118, දෙස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08,
දුරකතන අංක : 011 2686162 , 011 2679791.
ෆැක්ස් අංකය : 011 2686162 ඊ-මේල් : sliopdir@sltnet.lk වෙබ් අඩවිය : www.sliop.edu.lk

*ශාඛා* :- ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය,
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මාතලේ,
දුරකතන අංක : 0662222172,
071 0554298.

01-395

## ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ උපාධි අපේක්ෂක කෙඩෙට් තනතුරු

01. ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්‍ෂක විශ්වවිද්‍යාලය රත්මලාන සහ දක්ෂිණ මණ්ඩපය සූරියවැව උපාධි අපේක්‍ෂක කෙඩෙට් නිලධාරි / නිලධාරිනි තනතුරු සඳහා 2019.01.18 දින සිට 2019.02.01 දින දක්වා අයදුම්පත් භාරගනු ලැබේ.

02. ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්‍ෂක විශ්වවිද්‍යාලය ත්‍රිවිධ හමුදාවේ නිත්‍ය සේවයේ අධිකාරි තනතුරු සඳහා බඳවා ගන්නා ලදුව, උපාධියට නියමිත හමුදා සහ අධ්‍යයන විෂයයන් සාර්ථකව නිම කිරීමට සමත් වන කෙඩෙට් නිලධාරි/ නිලධාරිනියන්ට උපාධි පිරිනැමීම සඳහා 1981 අංක 68 දරන ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්‍ෂක විද්‍යාපීඨ පනත හා එම පනතේ සංශෝධන මගින් බලය පවරා ඇති විශ්වවිද්‍යාලයකි.

03. මෙම උපාධි අපේක්ෂක කෙඩෙට් නිලධාරි තනතුරුවලට අදාළ උපාධි පාඨමාලාවන් අතුරින් ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්‍ෂක විශ්වවිද්‍යාලය රත්මලාන හි දී පහත පාඨමාලාවන් පැවැත්වේ.-

- i. වෛද්‍යවේදී හා ශල්‍ය වෛද්‍යවේදී උපාධිය අවුරුදු පහ (අවුඃ 5) ක් ද,
- ii. විද්‍යාවේදී (බී.එස්.සී.) ඉංජිනේරු (ගෞරව) උපාධිය අවුරුදු හතරයි මාස හය (අවුඃ 4 1/2) ක් ද,
- iii. නීතිවේදී (එල්.එල්.බී.) උපාධිය අවුරුදු හතරයි මාස හය (අවුඃ 4 1/2) ක් ද,
- iv. විද්‍යාවේදී (බී.එස්.සී.) පරිගණක විද්‍යා (ගෞරව) උපාධිය අවුරුදු හතරයි මාස හය (අවුඃ 4 1/2) ක් ද,
- v. විද්‍යාවේදී (බී.එස්.සී.) මෘදුකාංග ඉංජිනේරු (ගෞරව) උපාධිය අවුරුදු හතරයි මාස හය (අවුඃ 4 1/2) ක් ද,
- vi. විද්‍යාවේදී (බී.එස්.සී.) පරිගණක ඉංජිනේරු (ගෞරව) උපාධිය අවුරුදු හතරයි මාස හය (අවුඃ 4 1/2) ක් ද,
- vii. විද්‍යාවේදී (බී.එස්.සී.) හටකාර්ය කළමනාකරණ උපාධිය අවුරුදු තුනයි මාස හය (අවුඃ 3 1/2) ක් ද,
- viii. විද්‍යාවේදී (බී.එස්.සී.) කළමනාකරණ හා කාර්මික විද්‍යා උපාධිය අවුරුදු තුනයි මාස හය (අවුඃ 3 1/2) ක් ද,
- ix. විද්‍යාවේදී (බී.එස්.සී.) සමාජ විද්‍යා උපාධිය අවුරුදු තුනයි මාස හය (අවුඃ 3 1/2) ක්ද වේ.
- x. විද්‍යාවේදී (බී.එස්.සී.) ක්‍රමෝපායික අධ්‍යයන සහ ජාත්‍යන්තර සබඳතා උපාධිය අවුරුදු තුනයි මාස හය (අවුඃ 3 1/2) ක් ද වේ.

ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්‍ෂක විශ්වවිද්‍යාලය සූරියවැව දක්ෂිණ මණ්ඩපය තුළ පහත පාඨමාලා පැවැත්වේ.

- xi. වාස්තුවිද්‍යාවේදී උපාධිය අවුරුදු පහයි මාස හය (අවුඃ 5 1/2) ක් ද,
- xii. විද්‍යාවේදී (බී.එස්.සී.) ප්‍රමාණ සමීක්‍ෂණ (ගෞරව) උපාධිය අවුරුදු හතරයි මාස හය (අවු 4 1/2) ක් ද,
- xiii. විද්‍යාවේදී (බී.එස්.සී.) මැනුම් විද්‍යා (ගෞරව) උපාධිය අවුරුදු හතරයි මාස හය (අවු 4 1/2) ක් ද,
- xiv. විද්‍යාවේදී (බී.එස්.සී.) තොරතුරු තාක්ෂණ (ගෞරව) උපාධිය අවුරුදු හතරයි මාස හය (අවු 4 1/2) ක් ද,
- xv. විද්‍යාවේදී (බී.එස්.සී.) තොරතුරු පද්ධති (ගෞරව) උපාධිය අවුරුදු හතරයි මාස හය (අවු 4 1/2) ක් ද,

3. 1 උපාධි පාඨමාලාව සඳහා බඳවා ගනු ලබන කෙඩෙට් නිලධාරීන් හා නිලධාරිනියන් ත්‍රිවිධ හමුදාවට අනුයුක්ත කිරීම එම හමුදාවල ඇති පුරප්පාඩු සංඛ්‍යාව සහ තෝරා ගැනීම සඳහා පවත්වනු ලබන සම්මුඛ පරීක්‍ෂණවලදී අපේක්ෂකයින් ලබාගන්නා මුළු ලකුණු සංඛ්‍යාව පදනම් කොට ගෙන සිදු කෙරෙනු ඇත. උපාධි පාඨමාලාව සම්පූර්ණ කිරීමෙන් අනතුරුව කෙඩෙට් නිලධාරීන්/නිලධාරිනියන් ශ්‍රී ලංකා යුධ හමුදාවේ, නාවික හමුදාවේ හෝ ගුවන් හමුදාවේ නිත්‍ය බල සේනාවල අධිකාරීලත් තනතුරු සඳහා පත්කරනු ලැබේ.

3. 2 නියමිත උපාධි පාඨමාලා සහ හමුදා පුහුණුව සාර්ථකව සම්පූර්ණ කිරීමෙන් පසුව අදාළ පරිදි ඔවුනට-

- වෛද්‍යවේදී හා ශල්‍ය වෛද්‍යවේදී (එම්.බී.බී.එස්.) උපාධිය; හෝ
- විද්‍යාවේදී (බී.එස්.සී.) ඉංජිනේරු (ගෞරව) උපාධිය; හෝ
- නීතිවේදී (එල්.එල්.බී.) උපාධිය; හෝ
- විද්‍යාවේදී (බී.එස්.සී.) පරිගණක විද්‍යා (ගෞරව) උපාධිය; හෝ
- විද්‍යාවේදී (බී.එස්.සී.) මෘදුකාංග ඉංජිනේරු (ගෞරව) උපාධිය; හෝ
- විද්‍යාවේදී (බී.එස්.සී.) පරිගණක ඉංජිනේරු (ගෞරව) උපාධිය; හෝ
- විද්‍යාවේදී (බී.එස්.සී) හටකාර්ය කළමනාකරණ උපාධිය; හෝ
- විද්‍යාවේදී (බී.එස්.සී) කළමනාකරණ හා කාර්මික විද්‍යා උපාධිය; හෝ
- විද්‍යාවේදී (බී.එස්.සී) සමාජ විද්‍යා උපාධිය; හෝ
- විද්‍යාවේදී (බී.එස්.සී.) ක්‍රමෝපායික අධ්‍යයන සහ ජාත්‍යන්තර සබඳතා උපාධිය හෝ

- වාස්තුවිද්‍යාවේදී උපාධිය; හෝ
- විද්‍යාවේදී (බී.එස්.සී.) ප්‍රමාණ සමීක්ෂණ (ගෞරව) උපාධිය; හෝ
- විද්‍යාවේදී (බී.එස්.සී.) මැනුම් විද්‍යා (ගෞරව) උපාධිය; හෝ
- විද්‍යාවේදී (බී.එස්.සී.) තොරතුරු තාක්ෂණ (ගෞරව) උපාධිය; හෝ
- විද්‍යාවේදී (බී.එස්.සී.) තොරතුරු පද්ධති (ගෞරව) උපාධිය හෝ පිරිනමනු ලැබේ

3. 3 සියලු උපාධි පාඨමාලා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් පැවැත්වේ.

3. 4 තෝරාගනු ලබන අපේක්ෂකයින් ඔවුන්ගේ සුදුසුකම්වලට අනුකූලව පහත දැක්වෙන උපාධි පාඨමාලාවලින් එකක් හැදෑරිය යුතුය.

(i). **වෛද්‍යවේදී හා ශල්‍ය වෛද්‍යවේදී (එම්.බී.බී.එස්) උපාධි පාඨමාලාව : කාලසීමාව අවුරුදු පහකි. (අවුː 5) - (කාන්තා/පිරිමි)**

2018 වර්ෂයේ අ.පො.ස (උ/පෙළ) විභාගයෙන්, **ජීව විද්‍යාව, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව** යන විෂයන් සඳහා අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ්‍යය (S) තුනක් (03) සහිතව **ජීව විද්‍යා විෂය ධාරාව** හදාරා විශ්වවිද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් ලැබූවන් සඳහා

(ii). **විද්‍යාවේදී (බී.එස්.සී) ගගන/ ගුවන්යානා නඩත්තු / ජීව වෛද්‍ය/ සිවිල්/ විදුලි හා විද්‍යුත් / විද්‍යුත් හා විදුලි සංදේශ / නාවික/ යාන්ත්‍රික/මෙකාට්‍රොනික් ඉංජිනේරු (ගෞරව) උපාධි පාඨමාලා : කාලසීමාව අවුරුදු හතරයි මාස හයකි. (අවුː 4 1/2) - (කාන්තා/පිරිමි)**

**2018** හෝ **2017** වර්ෂයේදී අපොස (උ/පෙළ) විභාගයෙන් **ගණිත විෂය** ධාරාව (රසායන විද්‍යාව, භෞතික විද්‍යාව සහ සංයුක්ත ගණිතය) හදාරා අවම වශයෙන් සම්මාන සාමාර්ථ්‍යය (C) දෙකක් සහ සාමාන්‍ය සාමාර්ථ්‍යය ( S ) එකක් සහිතව විශ්වවිද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් ලැබූවන් සඳහා

(iii). **නීතිවේදී (එල්.එල්.බී.) උපාධි පාඨමාලාව : කාලසීමාව අවුරුදු හතරයි මාස හයකි. (අවුː 4 1/2) - (පිරිමි)**

**2018** හෝ **2017** වර්ෂයේදී අ.පො.ස (උ/පෙළ) විභාගයේදී **පහත සඳහන් විෂයයන් අතරින් විෂයයන් තුනකට** (03) අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථ්‍යය තුනක් (03) ලබා විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම් කිරීමට අවශ්‍ය සුදුසුකම් ලැබූවන් සඳහා

| | | |
|---|---|---|
| ගිණුම්කරණය | දේශපාලන විද්‍යාව | කෘෂි විද්‍යාව |
| භූගෝල විද්‍යාව | ජීව විද්‍යාව | උසස් ගණිතය |
| ව්‍යාපාර සංඛ්‍යානය | ඉතිහාසය | ව්‍යාපාර අධ්‍යයනය |
| තර්ක ශාස්ත්‍රය සහ විද්‍යාත්මක ක්‍රමය | රසායන විද්‍යාව | ආර්ථික විද්‍යාව |
| භෞතික විද්‍යාව | ගණිතය/ සංයුක්ත ගණිතය | |
| සන්නිවේදන හා මාධ්‍ය අධ්‍යයනය | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | |

හෝ

**2018** හෝ **2017** වර්ෂයේදී අ.පො.ස (උ/පෙළ) විභාගයේදී **ඉහත සඳහන් විෂයයන් අතරින් එක් විෂයකට (01) හෝ දෙකකට** (02) අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථ්‍යය දෙකක් (02) සහ අනෙක් විෂය හෝ විෂයයන් පහත ලැයිස්තුවෙන් ලබා විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම් කිරීමට අවශ්‍ය සුදුසුකම් ලැබූවන් සඳහා-

| | | |
|---|---|---|
| බුද්ධ ධර්මය / බෞද්ධ ශිෂ්ටාචාරය | දෙමළ | චීන |
| ක්‍රිස්තු ධර්මය/ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය | සංස්කෘත | අරාබි |
| හින්දු ධර්මය / හින්දු ශිෂ්ටාචාරය | ප්‍රංශ | පාලි |
| ග්‍රීක / ග්‍රීක හා රෝම ශිෂ්ටාචාරය | සිංහල | ඉංග්‍රීසි (විෂයය අංක 73) |
| ඉස්ලාම් / ඉස්ලාම් ශිෂ්ටාචාරය | ජපන් | නාට්‍ය හා රංග කලාව |
| ජර්මන් | කෘෂි තාක්ෂණය | |

(iv). **විද්‍යාවේදී (බී.එස්.සී.) පරිගණක විද්‍යා (ගෞරව) උපාධි පාඨමාලාව : කාලසීමාව අවුරුදු හතරයි මාස හයකි. (අවුː 4 1/2) - (කාන්තා/පිරිමි)**

2018 හෝ 2017 වර්ෂයේදී අ.පො.ස (උ/පෙළ) විභාගයේදී ගණිත විෂයය ධාරාව යටතේ සංයුක්ත ගණිතය, භෞතික විද්‍යාව සහ පහත සඳහන් ඕනෑම විෂයයක්

රසායන විද්‍යාව
උසස් ගණිතය
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය
හදාරා අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ්‍යය ( S ) තුනක් (03) සහිතව විශ්වවිද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් ලැබූවන් සඳහා

(v). **විද්‍යාවේදී (බී.එස්.සී.) මෘදුකාංග ඉංජිනේරු (ගෞරව) උපාධි පාඨමාලාව : කාලසීමාව අවුරුදු හතරයි මාස හයකි. (අවුː 4 1/2) - (පිරිමි)**

2018 හෝ 2017 වර්ෂයේදී අ.පො.ස (උ/පෙළ) විභාගයේදී ගණිත විෂය ධාරාව යටතේ සංයුක්ත ගණිතය, භෞතික විද්‍යාව සහ පහත සඳහන් ඕනෑම විෂයයක්
රසායන විද්‍යාව
උසස් ගණිතය
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය
හදාරා අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ්‍යය ( S ) තුනක් (03) සහිතව විශ්වවිද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් ලැබූවන් සඳහා

(vi). **විද්‍යාවේදී (බී.එස්.සී.) පරිගණක ඉංජිනේරු (ගෞරව) උපාධි පාඨමාලාව : කාලසීමාව අවුරුදු හතරයි මාස හයකි. (අවුː 4 1/2) - (පිරිමි)**

2018 හෝ 2017 වර්ෂයේදී අ.පො.ස (උ/පෙළ) විභාගයේදී ගණිත විෂයය ධාරාව යටතේ සංයුක්ත ගණිතය, භෞතික විද්‍යාව සහ පහත සඳහන් ඕනෑම විෂයයක්
රසායන විද්‍යාව
උසස් ගණිතය
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය
හදාරා අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ්‍යය ( S ) තුනක් (03) සහිතව විශ්වවිද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම හා අවශ්‍ය සුදුසුකම් ලැබූවන් සඳහා

(vii). **විද්‍යාවේදී (බී.එස්.සී) කළමනාකරණ හා කාර්මික විද්‍යා උපාධි පාඨමාලාව : කාලසීමාව අවුරුදු තුනයි මාස හයකි. (අවුː 3 1/2). - (කාන්තා/පිරිමි)**

2018 හෝ 2017 වර්ෂයේදී අපොස (උ/පෙළ) විභාගය සඳහා ජීව විද්‍යා විෂයය ධාරාව, ගණිත විෂය ධාරාව යන විෂයයන් හදාරා අවම වශයෙන් සාමාන්‍ය ( S ) සාමාර්ථ්‍යය තුනක් (03) සහිතව විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා ඉල්ලුම් කිරීමට අවශ්‍ය සුදුසුකම් ලැබූවන් සඳහා

(viii). **විද්‍යාවේදී (බී.එස්.සී) හටකාර්ය කළමනාකරණ උපාධි පාඨමාලාව : කාලසීමාව අවුරුදු තුනයි මාස හයකි. (අවුː 3 1/2) - (කාන්තා/පිරිමි)**

2018 හෝ 2017 වර්ෂයේදී අ.පො.ස (උ/පෙළ) විභාගයේදී ජීව විද්‍යා විෂයය ධාරාව, ගණිත විෂයය ධාරාව හෝ වාණිජ විෂය ධාරාව හදාරා අවම වශයෙන් සාමාන්‍ය ( S ) සාමාර්ථ්‍යය තුනක් (03) සහිතව විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා ඉල්ලුම් කිරීමට අවශ්‍ය සුදුසුකම් ලැබූවන් සඳහා

(vix). **විද්‍යාවේදී (බී.එස්.සී) සමාජ විද්‍යා උපාධි පාඨමාලාව : කාලසීමාව අවුරුදු තුනයි මාස හයකි. (අවුː3 1/2) - (කාන්තා/පිරිමි)**

2018 හෝ 2017 වර්ෂයේදී අ.පො.ස (උ/පෙළ) විභාගයේදී ඕනෑම විෂයය ධාරාවකින් අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ්‍යය ( S ) තුනක් (03) සහිතව විශ්වවිද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් ලැබූවන් සඳහා

(x). **විද්‍යාවේදී (බී.එස්.සී) ක්‍රමෝපායික අධ්‍යයන සහ ජාත්‍යන්තර සබඳතා උපාධි පාඨමාලාව : කාලසීමාව අවුරුදු තුනයි මාස හයකි. (අවු:3 1/2) - (පිරිමි)**

2018 හෝ 2017 වර්ෂයේදී අ.පො.ස (උ/පෙළ) විභාගයේදී ඕනෑම විෂයය ධාරාවකින් අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ්‍යය ( S ) තුනක් (03) සහිතව විශ්වවිද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් ලැබූවන් සඳහා

(xi). **වාස්තුවිද්‍යාවේදී උපාධිය : කාලසීමාව අවුරුදු පහයි මාස හයකි. (අවු: 05 1/2) - (පිරිමි)**

2018 හෝ 2017 වර්ෂයේදී අපොස (උ/පෙළ) විභාගයේදී පහත සඳහන් විෂයයන් අතුරින් විෂයන් තුනකට (03) අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ්‍යය ( S ) තුනක් (03) ලබා විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම් කිරීමට අවශ්‍ය සුදුසුකම් ලැබූවන් සඳහා.

i. අවම වශයෙන් පහත ලැයිස්තුවෙන් එක් විෂයයක් :

ජීව විද්‍යාව
උසස් ගණිතය
රසායන විද්‍යාව
භෞතික විද්‍යාව
සංයුක්ත ගණිතය
චිත්‍ර
භූගෝල විද්‍යාව

සහ

ii. පහත ලැයිස්තුවෙන් එක් විෂයයක් හෝ විෂයයන් කිහිපයක්;

| | |
|---|---|
| ගිණුම්කරණය | චීන |
| හින්දු ශිෂ්ටාචාරය | ගෘහ ආර්ථික විද්‍යාව |
| ව්‍යාපාර සංඛ්‍යානය | තර්ක ශාස්ත්‍රය සහ විද්‍යාත්මක ක්‍රමය |
| ඉස්ලාම් ශිෂ්ටාචාරය | ගණිතය |
| ග්‍රීක හා රෝම ශිෂ්ටාචාරය | සංස්කෘත |
| දේශපාලන විද්‍යාවේ මූලිකාංග | ජර්මන් |
| ඉංග්‍රීසි (විෂයය අංක 73) | අරාබි |
| සිංහල | ඉතිහාසය |
| ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය | ව්‍යාපාර අධ්‍යයනය |
| සන්නිවේදන හා මාධ්‍ය අධ්‍යයනය | ජපන් |
| හින්දි | ආර්ථික විද්‍යාව |
| බෞද්ධ ශිෂ්ටාචාරය | පාලි |
| ප්‍රංශ | දෙමළ |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | කෘෂි විද්‍යාව |

සහ

iii. අවම වශයෙන් අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් ගණිතය විෂයයට සම්මාන (C) සාමාර්ථ්‍යයක් ලබා තිබීම හෝ අ.පො.ස. (උ/පෙළ) විභාගයෙන් ගණිතය විෂයයට සාමාන්‍ය (S) සාමාර්ථ්‍යයක් ලබා තිබීම.

සහ

iv. කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය විසින් පවත්වන අවකාශීය ඥානය පිළිබඳ ඇගයීම් පරීක්ෂණය සමත් විය යුතුය.

(xii). **විද්‍යාවේදී (බී.එස්.සී.) ප්‍රමාණ සමීක්ෂණ (ගෞරව) උපාධි පාඨමාලාව : කාලසීමාව අවුරුදු හතරයි මාස හයකි. (අවු: 04 1/2) - (පිරිමි)**

2018 හෝ 2017 වර්ෂයේදී අපොස (උ/පෙළ) විභාගයේදී පහත සඳහන් විෂයයන් අතුරින් විෂයන් තුනකට (03) අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ්‍යය ( S ) තුනක් (03) ලබා විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම් කිරීමට අවශ්‍ය සුදුසුකම් ලැබූවන් සඳහා.

පහත දැක්වෙන විෂයයන් අතුරින් අවම වශයෙන් එක් විෂයයකටද:
සංයුක්ත ගණිතය /උසස් ගණිතය;
සහ
පහත දැක්වෙන විෂයයන්ගෙන් අනෙකුත් විෂය / විෂයන්ටද පෙනී සිටිය යුතුය.

| | | |
|---|---|---|
| ගිණුම්කරණය | ආර්ථික විද්‍යාව | ව්‍යාපාර සංඛ්‍යානය |
| ව්‍යාපාර අධ්‍යයනය | භෞතික විද්‍යාව | රසායන විද්‍යාව |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | | |

ඊට අමතරව, අපේක්ෂකයන් අ.පො.ස. (සා.පෙළ) විභාගයේදී පහත සඳහන් අවශ්‍යතාවයන්ද සපුරා තිබිය යුතුය.

(අ) ගණිතය විෂයයට අවම වශයෙන් සම්මාන (C) සාමාර්ථයක්
(ආ) විද්‍යාව විෂයයට අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථයක්

(**xiii**). **විද්‍යාවේදී (බී.එස්.සී.) මැනුම් විද්‍යා (ගෞරව) උපාධි පාඨමාලාව : කාලසීමාව අවුරුදු හතරයි මාස හයකි. (අවු: 04 1/2) - (පිරිමි)**

2018 හෝ 2017 වර්ෂයේදී අපොස (උ/පෙළ) විභාගයෙන් ගණිත විෂය ධාරාව හදාරා අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථය ( S ) තුනක් (03) සහිතව විශ්වවිද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් ලැබූවන් සඳහා.

(**xiv**). **විද්‍යාවේදී (බී.එස්.සී.) තොරතුරු තාක්ෂණ (ගෞරව) උපාධි පාඨමාලාව : කාලසීමාව අවුරුදු හතරයි මාස හයකි. (අවු: 04 1/2) - (පිරිමි)**

2018 හෝ 2017 වර්ෂයේදී අපොස (උ/පෙළ) විභාගයෙන් ජීව විද්‍යා විෂය ධාරාව, ගණිත විෂය ධාරාව, වාණිජ විෂය ධාරාව හෝ කලා විෂය ධාරාව අතුරින් එක් විෂය ධාරාවක් හදාරා අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථය ( S ) තුනක් (03) සහිතව විශ්වවිද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් ලැබූවන් සඳහා.

(**xv**). **විද්‍යාවේදී (බී.එස්.සී.) තොරතුරු පද්ධති (ගෞරව) උපාධි පාඨමාලාව : කාලසීමාව අවුරුදු හතරයි මාස හයකි. (අවු: 04 1/2) - (පිරිමි)**

2018 හෝ 2017 වර්ෂයේදී අපොස (උ/පෙළ) විභාගයෙන් ජීව විද්‍යා විෂය ධාරාව, ගණිත විෂය ධාරාව, වාණිජ විෂය ධාරාව හෝ කලා විෂය ධාරාව යන විෂය ධාරාවන් අතුරින් එක් විෂය ධාරාවක් හදාරා අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථය ( S ) තුනක් (03) සහිතව විශ්වවිද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් ලැබූවන් සඳහා.

3. 5 තෝරාගනු ලබන කෙඩෙට් නිලධාරීන්/ නිලධාරිනියන් එම පාඨමාලාවට අදාල පොදු විෂයයන්ට අමතරව ඒ ඒ උපාධි පාඨමාලාවට අදාල වන පරිදි ඉංග්‍රිසි, කළමනාකරණය, තොරතුරු තාක්ෂණය, නීතිය, අන්තර් ජාතික අධ්‍යයනය හා හමුදා විෂයන්ද අනිවාර්යයෙන්ම හැදෑරිය යුතුය.

3. 6 මීට අමතරව ශාරීරික වර්ධනය, සරඹ හා අවි පුහුණුව, නායකත්වය ආදිය පිළිබඳවද පාඨමාලා කාලය තුළදී අඛණ්ඩ පුහුණුවීම්වල යෙදිය යුතුය.

04. <u>කෙඩෙට් නිලධාරී /නිලධාරිනී තනතුර සඳහා අවශ්‍ය අනෙකුත් සුදුසුකම්</u>

<u>අයදුම්කරු</u>

(අ) ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.

(ආ) <u>2019.02.01</u> වෙනි දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ 22 ට නොවැඩි විය යුතුයි.

<u>අධ්‍යාපන සුදුසුකම්</u> :-

(ඈ) අ.පො.ස (උ/පෙළ) විභාගයෙන් අදාල විෂය ධාරාවෙන්, විෂයයන් තුනකට අවම වශයෙන් සාමාන්‍ය ( S ) සාමාර්ථයන් 3 ක් ලබා විශ්වවිද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා සලකා බැලීමට අවශ්‍ය අවම සුදුසුකම් සපුරා තිබීම ;

සහ

(i) සාමාන්‍ය පොදු පරීක්ෂණයෙන් සමත් වීම
(ii) සියලුම උපාධි පාඨමාලා සඳහා අවම වශයෙන් අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් ඉංග්‍රීසි භාෂා විෂයයට සම්මාන (C) සාමාර්ථයක් ලබා තිබීම.
(iii) ශ්‍රී ලංකා ගුවන් හමුදාව වෙත සුදුසුකම් ලැබීමට පහත නිර්ණායකයන්ද සපුරා තිබිය යුතුය. සියලුම උපාධි පාඨමාලා සඳහා අවම වශයෙන් අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් ඉංග්‍රීසි, විද්‍යාව, ගණිතය විෂයයන්ට සම්මාන (C) සාමාර්ථ්‍ය සහිතව සම්මාන (C) සාමාර්ථ්‍ය 06 සමග අපොස සාමාන්‍ය පෙළ සමත් විය යුතුය. සිංහල හෝ දෙමළ භාෂාව සඳහා සාමාන්‍ය ( S ) සාමාර්ථ්‍යයක් ලබා තිබිය යුතුය.

ඈ. පහත සඳහන් අවම ශාරීරික මිනුම් (සම්මතයන්) සපුරා ලිය යුතුය.

| | | යුද | | නාවික | | ගුවන් | |
|---|---|---|---|---|---|---|---|
| | | පුරුෂ | ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී |
| උස | වෛද්‍ය | 5' 6" | 5' 3" | සෙ.මී. 168 | සෙ.මී. 160 | 5' 5" | 5' 3" |
| | වෙනත් උපාධි පාඨමාලා | 5' 6" | 5' 4" | | | 5' 6" | 5' 4" |
| බර | | කි.ග්‍රෑ. 50 | - | කි.ග්‍රෑ. 52 | කි.ග්‍රෑ. 41 | - | - |
| ශරීර ස්කන්ධ දර්ශකය | | - | - | - | - | <26 සහ >17 | <25 සහ >17 |
| පපුව | | 32" (ප්‍රාශ්වාස) | - | 81 cm | - | 32" | - |

| පෙනීම | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| යුද | | නාවික | | ගුවන් | | | |
| වම | දකුණ | වම | දකුණ | වම | දකුණ | උපැස්/කාච භාවිතා කිරීම | වර්ණ |
| 6/9 | 6/6 | 6/6 | 6/6 | 6/6 | 6/6 | භාවිතා නොකිරීම | CP 2 |
| උපැස්/කාච රහිත | | උපැස්/කාච රහිත | | | | | |

සටහන :- ක්‍රීඩා හෝ වෙනත් අදාළ විෂයයන්හි ජාතික මට්ටමේ කුසලතා දක්වා ඇති අයදුම්කරුවන් සඳහා ඉහත සඳහන් ශාරීරික මිනුම් පිළිබඳ අවශ්‍යතාවයන් ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ අභිමතය පරිදි ලිහිල් කිරීමට අවකාශ ඇත.

(ඉ) අයදුම්කරු මනා සෞඛ්‍ය තත්ත්වයක සිටිය යුතු අතර ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ කළමණාකරන මණ්ඩලයේ සභාපති සෑහීමට පත්වන පරිදි වෛද්‍ය

පරීක්ෂණයකින් සමත්වීම මෙන්ම පිළිගත් ආකෘතියට අනුව සකසන ලද සෞඛ්‍ය ප්‍රකාශන හා පරීක්ෂණ ආකෘති පත්‍රය ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ. තවද, අධ්‍යයන පාඨමාලාවට තේරී පත්වීමට පෙර යම් අයදුම්කරුවෙක් විසින් සෞඛ්‍ය ප්‍රකාශන හා පරීක්ෂණ ආකෘති පත්‍රයෙහි අසත්‍ය තොරතුරු සපයා ඇති බව අනාවරණය වුවහොත් එවැනි අයදුම්කරුවෙක් අධ්‍යයන කටයුතු සඳහා නුසුදුස්සකු වන අතර අසත්‍ය තොරතුරු සැපයීම හේතුවෙන් අධ්‍යයන පාඨමාලාවෙන් ඉවත් කරනු ලැබේ.

සෞඛ්‍ය ප්‍රකාශන හා පරීක්ෂණ ආකෘති පත්‍රය විශ්වවිද්‍යාල වෙබ් අඩවියෙන් ලබා ගත හැක.

මෙම විශ්වවිද්‍යාල වෙබ් අඩවිය www.kdu.ac.lk

(ඊ) අවිවාහක විය යුතු වේ. (උපාධි අපේක්ෂක කෙඩෙට් නිලධාරියෙකුට/ නිලධාරිනියකට පුහුණුවීම් කාලය තුළදී විවාහ වීමට අවසර නොමැති අතර සේවා රෙගුලාසි මගින් අවකාශ සැලසෙන තෙක් විවාහ වීමට අවසර දෙනු නොලැබේ.)

5. **සේවා කොන්දේසි** :- තෝරාගනු ලබන අපේක්ෂකයින් ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ රත්මලාන හෝ සූරියවැව දක්ෂිණ මණ්ඩපයේ උපාධි අපේක්ෂක කෙඩෙට් නිලධාරීන්/නිලධාරිනියන් ලෙස බඳවා ගැනේ. ඔවුන් 1981 අංක 68 දරන ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විද්‍යාපීඨ පනත සහ එම පනතේ සංශෝධනයන්ටද අනුකූලව විශ්වවිද්‍යාලය මගින් කලින් කලට පනවන ලද්දාවූ නීති, රෙගුලාසි සහ නියෝග යන්ට යටත් වනු ඇත. බඳවාගනු ලබන අපේක්ෂකයින් නිත්‍ය සේවාවේ අධිකාරියට පත්කිරීම හා අදාළ උපාධිය ලබා ගැනීමෙන් පසුව අඛණ්ඩ සහ නිරන්තර අනිවාර්ය වසර 12 කට නොඅඩු සේවා කාලයක් සේවය කල යුතු වේ.

6. බඳවාගනු ලබන අපේක්ෂකයින් නිත්‍ය සේවාවේ අධිකාරියට පත්කිරීම හා අදාළ උපාධිය ලබා ගැනීමෙන් පසුව එම සේවාවන්ට අදාළ වන පරිදි අනිවාර්ය සේවා කාලයක් සේවය කරන බවට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සමග ගිවිසුමකට හා බැඳුම්කරයකට ඇතුලත් විය යුතුය.

7. උපාධි අපේක්ෂක කෙඩෙට් නිලධාරියෙකුට/ නිලධාරිනියකට හිමි වැටුප් හා දීමනා ගෙවනු ලැබේ. උපාධි අපේක්ෂක කෙඩෙට් නිලධාරියෙකුගේ/නිලධාරිනියකගේ මාසික වැටුප ආසන්න වශයෙන් රු. 38,000/- ක් පමණ වේ. මෙයට අමතරව පහත සඳහන් පහසුකම්ද නොමිලේ සපයනු ලැබේ.

I. ආහාර හා නවාතැන්
II. නිල ඇඳුම්
III. අනුගාමික සේවාවන්
IV. ක්‍රීඩා හා විනෝද පහසුකම්
V. වෛද්‍ය පහසුකම්

8. ශ්‍රී ලංකා යුද හමුදාවේ, නාවික හමුදාවේ හෝ ගුවන් හමුදාවේ නිත්‍ය සේවාවන්ට පත්කිරීමෙන් අනතුරුව ඔවුන් තම පදවිවලට අදාළ වන පරිදි එම සේවාවන්ට බලපාන වැටුප් සහ දීමනා සඳහා හිමිකම් ලබනු ඇත.

(අ) පහත සඳහන් මාසික දීමනාවන්ද ගෙවනු ලැබේ. ׃

I. සුදුසුකම් දීමනා
II. ආහාර දීමනාව
III. ඇතුලත විසීමට නියෝග ලැබ සිටින විට වික්ෂේපණ දීමනාවක් (විවාහක නිලධාරීන්ට පමණක්)
IV. නිල ඇඳුම් නඩත්තු කිරීමේ දීමනාව

(ආ) පහත සඳහන් පහසුකම් සපයනු ලැබේ./ දීමනා ගෙවනු ලැබේ ׃

I. ඇතුලත විසීමට නියෝග ලැබ සිටින විට නොමිලයේ නේවාසික පහසුකම්
II. කුලී නිවාසයක වාසය කරන විට සීමිත ගෙවල් කුලී

III. නිල ඇඳුම් දීමනා
IV. විවාහක නිලධාරීන්ට අනුගාමික දීමනා/ අවිවාහක නිලධාරීන්ට අනුගාමික සේවය

9. ශ්‍රී ලංකා යුධ, නාවික සහ ගුවන් හමුදා නිලධාරීන්ගේ වැටුප් හා සේවා කොන්දේසි පහත සඳහන් රෙගුලාසි මගින් පාලනය වනු ඇත.

(අ) යුධ හමුදා/නාවික හමුදා/ ගුවන් හමුදා වැටුප් සංග්‍රහය

(ආ) යුධ හමුදා/ නාවික හමුදා/ගුවන් හමුදා නිලධාරීන් උදෙසා ශ්‍රී ලංකා ගැසට් පත්‍රයේ පළ කරනු ලබන වලංගු රෙගුලාසි

(ඇ) ශ්‍රී ලංකා *ගැසට් පත්‍රයේ* පළ කරන වලංගු යුධ හමුදා/ නාවික හමුදා/ ගුවන් හමුදා විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික සංග්‍රහය

10. පුහුණුවීම් කාලය තුළදී උපාධි අපේක්ෂක කෙඩෙට් නිලධාරීන්/නිලධාරිනියන් ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ උපකුලපති සහ/හෝ අදාළ හමුදාපතිවරු විසින් නියම කරනු ලබන පුහුණුවීම්වල නිරත විය යුතු වේ.

11. පුහුණුව ලබන උපාධි අපේක්ෂක නිලධාරීන්/නිලධාරිනියන් පුහුණුවීම් සඳහා ශ්‍රී ලංකාවේ හෝ විදේශයන්හි ඕනෑම ප්‍රදේශයකට පත්කොට යැවිය හැකිය.

12. පුහුණුව ලබන උපාධි අපේක්ෂක නිලධාරීන්/නිලධාරිනියන් ඔවුන් සඳහා වෙන් කොට ඇති නේවාසික ස්ථානයන්හි සිටිය යුතු අතර ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ හෝ අදාළ වෙනත් සේවා ආයතන මගින් පනවන ලද දින චර්යාවන් අනුගමනය කළ යුතුයි.

13. *භාෂා අවශ්‍යතා* - තෝරා ගනු ලබන අයදුම්කරුවන් විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරනු වස් මේ දක්වා පනවනු ලැබ ඇත්තා වූද, ඉදිරියේදී පනවනු ලැබිය හැක්කා වූද, නීතින්ට අනුකූලව කටයුතු කළ යුතුයි.

14. *අනන්‍යතාවය ඔප්පු කිරීම* :- අපේක්ෂකයින් විසින් ඔවුන්ගේ අනන්‍යතාවය ඔප්පු කිරීම පිණිස සාක්ෂි ඉදිරිපත් කිරීම අවශ්‍ය වනු ඇත. මේ සඳහා පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද හඳුනාගැනීමේ පත හෝ ගුවන් ගමන් බලපත්‍රය හෝ තැපැල්පති විසින් නිකුත් කරන ලද හඳුනාගැනීමේ පත හෝ මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් නිකුත් කරන ලද රියදුරු බලපත්‍රය පිළිගනු ලැබේ.

15. අයදුම්පත් :- මෙම විශ්වවිද්‍යාල වෙබ් අඩවියෙන් අදාළ අයදුම්පත්‍රය ලබාගෙන අයදුම් කළ හැක. මෙම විශ්වවිද්‍යාල වෙබ් අඩවිය **www.kdu.ac.lk**

16. නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් එවීමේදී ලංකා බැංකුවේ ඕනෑම ශාඛාවකට රුපියල් දහස (රු: 1000/=) මුදලක් "උපකුලපති, ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය" නමින් ලංකා බැංකුවේ ''මොරටුව - ඉඩම'' ශාඛාවේ අංක ''9405831'' ගිණුමට බැර කර, ඔබ වෙත ලැබෙන ලදුපතේ මුල් පිටපත අයදුම්පත සමග අමුණා එවිය යුතුය. අවශ්‍ය මූලික සුදුසුකම් නොමැති හෝ ඉල්ලුම්පත් නිසි ලෙස සම්පූර්ණ කර නොමැති හෝ මෙහි සඳහන් කොන්දේසිවලට අනුකූල නොවන හෝ අයදුම්පත්, කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කෙරෙන අතර, අයදුම්පත් එවීමේදී ගෙවනු ලැබූ මුදල් කිසිදු ලෙසකින් ආපසු ගෙවනු නොලැබේ. උපකුලපතිතුමා විසින් පත්කරනු ලබන තේරීම් කමිටුවක් මගින් තීරණය කරනු ලබන්නා වූ නිර්ණායකයන්ට අනුකූලව, ඉහත සඳහන් අවශ්‍යතාවයන් සපුරා ඇති අයදුම්කරුවන් අතුරින් මූලික තේරීම් සිදු කරනු ලබන අතර එසේ තෝරා ගන්නා ලද අයදුම්කරුවන් මූලික සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවීම් කරනු ලැබේ.

17 සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍ර 2019.02.01 වෙනි දින හෝ එදිනට පෙරාතුව ලැබෙන සේ ''ලේඛකාධිකාරී'' ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය, රත්මලාන." යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු වේ. අයදුම් පත්‍රය බහා එවන කවරයේ ඉහල වම් කෙළවරේ ''කෙඩෙට් නිලධාරී/ නිලධාරිනී තනතුර සඳහා අයදුම්පත'' යනුවෙන් සහ ඉල්ලුම් කරනු ලබන උපාධි පාඨමාලාව සඳහන් කළ යුතුය. ප්‍රමාද වී ලැබෙන ඉල්ලුම්පත්‍ර සහ මෙම *ගැසට් නිවේදනයේ* සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල නොවන්නා වූ ඉල්ලුම්පත්‍රද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

18 රාජ්‍ය හෝ සංස්ථා සේවයෙහි නිරත නිලධාරීන්ගේ/ නිලධාරිනියන්ගේ අයදුම්පත් දෙපාර්තමේන්තු/ සංස්ථා ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතු අතර එකී අයදුම්කරුවන් තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය අදාළ තනතුරෙන් නිදහස් කළ හැකි බව සඳහන් අදාළ ආයතන ප්‍රධානියාගේ සහතිකයක් ද තිබිය යුතුය.

19 උප්පැන්න සහතිකය, අ.පො.ස (සා/පෙළ), අ.පො.ස (උ/පෙළ) විභාග සඳහා ප්‍රතිඵල ලේඛනවල **සහතික කරන ලද ඡායා පිටපත්** සහ විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලබා ඇති බවට නිකුත් කරන ලද ප්‍රතිඵල සටහනේ පිටපතක් යන ලේඛනවල පිටපත් **පමණක්** අයදුම්පත්‍රය සමග අමුණා එවිය යුතුය.

20 ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ කළමනාකරණ මණ්ඩලය මගින් පත්කරනු ලබන තේරීම් කමිටුවක් මගින් තීරණය කරනු ලබන්නා වූ නිර්ණායකයන්ට අනුකූලව ඉහත සඳහන් අවශ්‍යතාවයන් සපුරා ඇති අයදුම්කරුවන් අතුරින් මූලික තේරීම් කරනු ඇත. මෙසේ තෝරා ගනු ලබන්නා වූ අපේක්ෂකයින් ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ කළමනාකරණ මණ්ඩලය විසින් අවශ්‍යයයි තීරණය කරනු ලබන්නා වූ වෙනත් පරීක්ෂණයන්ට ද පෙනී සිටිය යුතු වේ.

21 සම්මුඛ පරීක්ෂණ සහ වෙනත් පරීක්ෂණ සඳහා කැඳවනු ලබන අපේක්ෂකයින්ට එම පරීක්ෂණ පවත්වනු ලබන ස්ථාන, වේලාවන් හා දින ලිඛිතව හෝ විශ්වවිද්‍යාලීය වෙබ් අඩවිය මගින් දැනුම් දෙනු ලැබේ. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් කිසිවක් මෙම විශ්වවිද්‍යාලය මගින් ගෙවනු නොලැබේ.

22 අපේක්ෂකයෙකු නිර්දේශ කිරීමට අදහස් කරනු ලබන කවරෙකු විසින් වුවද එසේ කළ යුත්තේ ඔහුට ඒ පිළිබඳව සහතිකයක් ලබා දීමෙනි. **අපේක්ෂකයෙකු තෝරා ගැනීම සඳහා කවර ආකාරයකින් හෝ පෙළඹවීම හෝ නැතහොත් බලපෑම් කිරීමට උත්සාහ කිරීම එම අපේක්ෂකයා නුසුදුස්සෙකු වීමට හේතු වන්නේය.**

23 අයදුම්පත් ලද බැව් මෙම විශ්වවිද්‍යාලය විසින් දැනුම් දෙනු නොලැබේ. ප්‍රතික්ෂේප කරනු ලබන අයදුම්පත් සම්බන්ධව කෙරෙන විමසුම් හෝ ලියකියවිලිද පිළිගනු නොලැබේ.

24 සිංහල හා දෙමළ මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

හේමසිරි ප්‍රනාන්දු,
ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් සහ,
ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක
විශ්වවිද්‍යාලයේ කළමනාකරණ මණ්ඩලයේ සභාපති.

01-765

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.